*සැ. යු.*– 2007.07.06 වැනි දින පළකරන ලද 1,505 දරන *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොකරන ලදී.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,506 - 2007 ජූලි 13 වැනි සිකුරාදා - 2007.07.13**

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | 700 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... .. | 703 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | — | රට බිම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | 700 | වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් .. ... ... | 706 |
| තොවුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — | විවිධ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැලසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2007 ජූලි මස 20 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2007 ජූලි මස 06 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂ්මන් ගුණවර්ධන**,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2007 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය -අම්පාර

### රාජසන්තක කරන ලද මෝටර් වාහන විකිණීම සඳහා ටෙන්ඩර් කැඳවීම

අම්පාර දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය විසින් රාජසන්තක කරන ලද පහත උපලේඛනයේ සඳහන් මෝටර් වාහන විකිණීම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබේ.

02. ටෙන්ඩර් පෝරම ගාස්තු පහත උපලේඛනයේ සඳහන් වන පරිදි ගෙවිය යුතු අතර, 2007.07.23 දින සිට 2007.08.15 දින ප. ව. 3.30 තෙක් දිසා මහෙස්ත්‍රාත් අධිකරණ කාර්යාලයෙන් පෝරම ලබාගත හැක.

03. ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර්පත් 2007.08.17 දින ප. ව. 2.30 ට පෙර දිසා විනිසුරුතුමා, දිසා මහෙස්ත්‍රාත් අධිකරණය අම්පාර යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු වේ.

04. ටෙන්ඩර් ඉදිරිපත් කරනු ලබන කවරයේ වම්පස උඩ කෙළවරේ රාජසන්තක කරන ලද මෝටර් වාහන විකිණීම සඳහා ටෙන්ඩර් යනුවෙන් සඳහන් කළ යුතුය.

05. එකී ටෙන්ඩර් පත්‍ර මහාධිකරණ ටෙන්ඩර් මණ්ඩලය ඉදිරියේ විවෘත කරනු ලබන අතර, එම දිනය හා වේලාව ටෙන්ඩර්කරුවන්ට දන්වනු ලබන අතර, එදිනට එකී වේලාවට ටෙන්ඩර් අයදුම්කරුවන්ට හෝ බලය පවරනු ලබන නියෝජිතයෙකුට ඒ අවස්ථාවට සහභාගි විය හැකිය.

06. වැඩිම මිල ඉදිරිපත් කළ ඉල්ලුම්කරුට ටෙන්ඩර් මණ්ඩලය විසින් නියම කරනු ලබන දිනට පෙර සියලුම මුදල් ගෙවා අදාල භාණ්ඩ රැගෙන යා යුතුය.

07. ටෙන්ඩර් මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

### උපලේඛනය

| *අනු අංකය* | *නඩු අංකය* | *වාහන අංකය* | *ආපසු නොගෙවන (පෝර්ම ගාස්තු)* | *ආපසු ගෙවන මුදල (ඇප තැන්පතු)* |
|---|---|---|---|---|
| 01. | 10057/එස් | 27 ශ්‍රී 1694 ලේලන්ඩ් ලොරි රථය | 100 | 1,000 |
| 02. | 21850/එස් | 24 ශ්‍රී 8171 ඉසුසු ලොරි රථය | 100 | 1,000 |
| 03. | 23008/එස් | 41 ශ්‍රී 1699 ඉසුසු එල්ෆ් ලොරි රථය | 200 | 2,000 |

දිසා විනිසුරු සහ මහෙස්ත්‍රාත්,
අම්පාර.

2007 ජුනි මස 25 වැනි දින,
අම්පාර දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

07-300/2

# බඩු බාහිරාදිය විකිණීම්

## දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය – අම්පාර

### අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබූ භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

අම්පාර මහෙස්ත්‍රාත් අධිකරණයේ අවසන් වූ නඩුවලට අදාල රාජසන්තක කරන ලද හා මෙතෙක් හිමිකම් නොපාන ලද පහත සඳහන් භාණ්ඩ 2007 අගෝස්තු මස 18 වැනි දින පෙ. ව. 10.00 ට අම්පාර දිසා/මහෙස්ත්‍රාත් අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙහි පහත සඳහන් කිසියම් භාණ්ඩයක් සම්බන්ධයෙන් හිමිකම් කියන අයකු වෙතොත් වෙන්දේසිය ආරම්භ කිරීමට ප්‍රථම තම හිමිකම් අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය මත එදින පෙ. ව. 9.15 සිට පෙ. ව. 9.45 දක්වා කාලය තුළ භාණ්ඩ පරීක්ෂා කර බැලීමට ඉඩදෙනු ලැබේ. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවලදී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩයන් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

වෙන්දේසියේ දී මිලදී ගනු ලබන භාණ්ඩයන් සඳහා එවලේ ම මුදල් ගෙවිය යුතු අතර, චෙක්පත්, මුදල් ඇණවුම් ආදිය භාරගනු නොලැබේ.

වෙන්දේසියෙන් මිලදී ගනු ලබන භාණ්ඩයන් එදිනම අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතුය. වෙන්දේසිය සම්බන්ධයෙන් පැමිණිලි කිසිවක් තිබේ නම් වෙන්දේසිය පවතින අවස්ථාවේ දී ඉදිරිපත් කළ යුතු අතර, වෙන්දේසියෙන් පසුව ලැබෙන පැමිණිලි කිසිවක් භාරගනු නොලැබේ.

වෙන්දේසියේ භාණ්ඩ ඉල්ලීමට පැමිණෙන්නන් ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතුය.

දිසා විනිසුරු සහ මහේස්ත්‍රාත්,
අම්පාර.

2007 ජූනි මස 25 වැනි දින,
අම්පාර දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 01. | 21157/ඊ | අංක 136-7845 එම්. ඩී. 70 දරන හොණ්ඩා යතුරුපැදි | 01 |
| 02. | 16278/එස් | ඊ. පී. ජී. බී. 6453 හීරෝ හොණ්ඩා වර්ගයේ යතුරුපැදි | 01 |
| 03. | 22238/එස් | 142-9862 ජාලින් 70 වර්ගයේ යතුරුපැදි | 01 |
| 04. | 8183/ඒආර් | අංක ජේ. ජේ. 075196 දරන ටොම්හොක් දරන පාපැදි | 01 |
| 05. | 8821/ඒආර් | අංක 55740621 දරන ලුමාලා පාපැදි | 01 |
| 06. | 9711/ඒආර් | අංක 955 පී 4522 දරන පාපැදි | 01 |
| 07. | 9622/ඒආර් | අංක කේ 123771 දරන පාපැදි | 01 |
| 08. | 8820/ඒආර් | අංකය අපැහැදිලි පාපැදි | 01 |
| 09. | 9836/ඒආර් | අංකය අපැහැදිලි පාපැදි | 01 |
| 10. | 22459/එස් | අංක පීසීඅයි 54202 දරන පාපැදි | 01 |
| 11. | 92318 | අංක එච්ජ් 29/11478 දරන ජීනික්ස් වර්ගයේ පාපැදි | 01 |
| 12. | 92406/ඊ | අංකය අපැහැදිලි හීරෝ වර්ගයේ පාපැදි | 01 |
| 13. | 13064/එස් | අංක ඊඑන් 3123 දරන පාපැදි | 01 |
| 14. | 13063/එස් | අංක සී 3086 දරන පාපැදි | 01 |
| 15. | 13065/එස් | අංක පීසී 151616 දරන පාපැදි | 01 |
| 16. | 23162/එස් | දිරාගිය උදලු මිට | 40 |
| | | අංක එස්. ආර්. 16546 රෝමා වර්ගයේ පාපැදි | 01 |
| 17. | 9911/ඒආර් | අඩි 06ක් දිග ඉරුම් කියත් | 01 |
| 18. | 82730 | ඉරුම් කියත් | 01 |
| | | අඩි කෝදු | 01 |
| | | කියත් අඩු | 01 |
| 19. | 14497 (2510/බී) | බන්ඩි කියත් | 01 |
| 20. | 24362/ඊ | ඇලුමිනියම් තාච්චි | 01 |
| | | ඇලුමිනියම් කළ | 01 |
| 21. | 24724 | වයර් මීටර් | 14 |
| | | හෝල්ඩර් | 02 |
| | | බල්බ් | 02 |
| 22. | 24725 | වයර් මීටර් | 10 |
| | | හෝල්ඩර් | 01 |
| | | බල්බ් | 01 |
| 23. | 24726 | වයර් මීටර් | 11 |
| | | බල්බ් | 01 |
| | | හෝල්ඩර් | 01 |
| 24. | 24729 | වයර් මීටර් | 17 |
| | | හෝල්ඩර් | 02 |
| | | බල්බ් | 02 |
| 25. | 24730 | වයර් මීටර් | 11 |
| | | හෝල්ඩර් | 02 |
| | | බල්බ් | 02 |
| 26. | 24731 | වයර් මීටර් | 07 |
| | | හෝල්ඩර් | 01 |
| | | බල්බ් | 01 |
| 27. | 24732 | වයර් මීටර් | 09 |
| | | හෝල්ඩර් | 01 |
| | | බල්බ් | 01 |
| 28. | 24733 | වයර් මීටර් | 14 |
| | | හෝල්ඩර් | 01 |
| | | බල්බ් | 01 |
| 29. | 24734 | වයර් මීටර් | 12 |
| | | හෝල්ඩර් | 01 |
| | | බල්බ් | 01 |
| 30. | 23676/එප් | ලී ඉරන කියත් | 01 |
| | | ලබ | 01 |
| | | පීරි | 01 |
| | | පිහි | 01 |
| 31. | 23675/එප් | ලී ඉරන කියත් | 01 |
| 32. | 13063/එස් | පිහි | 01 |
| 33. | 26181 | බැරල් | 01 |
| 34. | 25908 | ඇලුමිනියම් මුට්ටි | 01 |
| 35. | 23245 | සවල් | 01 |
| | | බාල්දි | 01 |
| 36. | 23243 | බාල්දි | 01 |
| 37. | 23244 | බාල්දි | 01 |
| 38. | 24022 | බාල්දි | 01 |
| 39. | 24021 | බාල්දි | 01 |
| 40. | අංක රහිත | සවල් | 01 |
| 41. | අංක රහිත | සවල් | 01 |
| 42. | අංක රහිත | බාල්දි | 01 |
| 43. | අංක රහිත | බාල්දි | 01 |
| 44. | අංක රහිත | බාල්දි | 01 |
| 45. | අංක රහිත | බාල්දි | 01 |
| 46. | අංක රහිත | උදලු | 01 |
| 47. | අංක රහිත | උදලු | 01 |
| 48. | අංක රහිත | උදලු | 01 |
| 49. | 3017 | යකඩ පොලු | 01 |
| 50. | අංක රහිත | වයර් තොගයක් | |

07-300/1

## පොලිස් දෙපාර්තමේන්තුව

### භාණ්ඩ වෙන්දේසිය– කන්තලේ කොට්ඨාසය

පොලිස් දෙපාර්තමේන්තුවේ කන්තලේ කොට්ඨාශයේ පොලිස්ථාන වල භාවිතා කරන ලද පාවිච්චියට ගත නොහැකි අබලි භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කන්තලේ පොලිස්ථාන පරිශ්‍රය තුළදී 2007 ජූලි මස 20 වැනි දින පැය 09.00 ට සිදු කෙරේ.

විකිණීමට නියමිත භාණ්ඩ 2007 ජූලි මස 19 වැනි දින පැය 13.00 සිට පැය 16.00 දක්වා අදාල පරිශ්‍රය තුළදී පරීක්ෂා කර බැලිය හැකිය. භාණ්ඩ වෙන්දේසිය සඳහා කන්තලේ පොලිස්ථාන පරිශ්‍රයට ඇතුල් වන සියලුම පුද්ගලයින් තමන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතුයි. විකිණීමට නියමිත භාණ්ඩ වෙන්දේසිය සඳහා ඉදිරිපත් කිරීම, අවම ලන්සුව ප්‍රකාශයට පත් කිරීම, වෙන්දේසියෙන් ඉවත් කිරීම සහ අනෙකුත් සියලුම කටයුතු වල අවසාන තීරණය වෙන්දේසි මණ්ඩලයේ තීරණය වේ.

වෙන්දේසියෙන් මිළදී ගනු ලබන භාණ්ඩ සඳහා එවේලේම මුදල් ගෙවා රිසිට් පතක් ලබා ගත යුතු අතර භාණ්ඩ නිදහස් කර ගැනීමේ දී එම රිසිට් පත ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ. චෙක්පත් භාර ගනු නොලැබේ.

වෙන්දේසියෙන් මිළදී ගන්නා භාණ්ඩ 2007 ජූලි මස 20 වන දින පැය 16 00ට පෙර අදාල පරිශ්‍රයෙන් ඉවත් කර ගත යුතු අතර එසේ ඉවත් කරනු නොලබන භාණ්ඩ සම්බන්ධව වග කියනු නොලැබේ.

විකිණීමට නියමිත භාණ්ඩ ලැයිස්තුව පහත උපලේඛනයෙන් දැක්වේ.

එච්. එස්. දයානන්ද,
ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී,
කන්තලේ කොට්ඨාශ භාර.

### උපලේඛනය

| *භාණ්ඩය* | *ප්‍රමාණය* |
|---|---|
| 01. පොරෝ තල | 10 |
| 02. එමර්ජන්සි ලයිට් | 01 |
| 03. බාල්දි ලොකු | 10 |
| 04. බාල්දි කුඩා | 25 |
| 05. බුෂ් කටර් | 01 |
| 06. මල් බාල්දි | 02 |
| 07. කටු කම්බි රෝල් | 05 |
| 08. හිරමනා තල | 23 |
| 09. කල්දේරම් ලොකු | 08 |
| 10. කල්දේරම් මධ්‍යම | 10 |
| 11. කල්දේරම් කුඩා | 15 |
| 12. කොම්පියුටර් මොනිටර් | 01 |
| 13. කැතිතල | 03 |
| 14. ඩ්‍රැගන් ලයිට් | 02 |
| 15. අධි ශීතකරණ | 01 |
| 16. සිවිල් ෆෑන් | 04 |
| 17. ස්ටෑන්ඩ් ෆෑන් | 02 |
| 18. ගෑස් කුකර් | 02 |
| 19. ගෑස් සිලින්ඩර් | 01 |
| 20. හැලජන් ලාම්පු | 25 |
| 21. යකඩ ඇඳන් තනි | 08 |
| 22. යකඩ ඇඳන් යුගල | 02 |
| 23. යකඩ පුටු | 28 |
| 24. වානේ කබඩ් | 01 |
| 25. කොරෝස් | 01 |
| 26. සාස්පාන් කුඩා හා මධ්‍යම | 23 |
| 27. ලන්තෑරුම් | 26 |
| 28. උදලු තල | 13 |
| 29. මල්ටි පොට් | 02 |
| 30. පිහියා | 22 |
| 31. පාපැදි | 06 |
| 32. පැට්‍රල් මැක්ස් ලාම්පු | 02 |
| 33. පොටෝ කොපි යන්ත්‍ර | 01 |
| 34. රේක්ක | 10 |
| 35. රයිස් කුකර් | 01 |
| 36. පොඩි හැඳි | 06 |
| 37. බත් හැඳි | 02 |
| 38. සවල් | 07 |
| 39. ටයිප් රයිටර් සිංහල | 02 |
| 40. තාච්චි | 06 |
| 41. ටියුබ් ලයිට් සෙට් | 77 |
| 42. වීදි ලාම්පු | 28 |
| 43. රූපවාහිණී යන්ත්‍ර | 01 |
| 44. ටෝච් ලයිට් | 26 |
| 45. ටේබල් පෑන් | 04 |
| 46. විසිකැති | 24 |
| 47. වතුර පිල්ටර් | 12 |
| 48. වතුර බොයිලේරු | 03 |
| 49. වතුර මෝටර් | 01 |
| 50. ගිනි නිවන උපකරණ | 05 |
| 51. ගිනි නිවන උපකරණ | 01 |

07-227

---

## පොලිස් දෙපාර්තමේන්තුව

### උපසේවා පොලිස් මූලස්ථානය

පොලිස් දෙපාර්තමේන්තුව උපසේවා පොලිස් මූලස්ථාන කොට්ඨාශයට අයත් පාවිච්චියට ගත නොහැකි භාණ්ඩ 2007 ජූලි මස 27 දින පෙරවරු 9.30ට කොළඹ 07, මලලසේකර මාවතේ අංක 15 දරන උපසේවා පොලිස් මූලස්ථාන පරිශ්‍රය තුල දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

පහත උපලේඛනයේ සඳහන් අදාල භාණ්ඩ පරීක්ෂා කර බැලීම 2007 ජූලි මස 26 වැනි දින පැය 13.00 සිට පැය 16.00 දක්වා පරීක්ෂා කර බැලිය හැක.

වෙන්දේසි භූමියට ඇතුල්වන සියලුම තරා තිරමේ පුද්ගලයින් තම අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත හෝ විදේශ ගමන් බලපත්‍රය ඉදිරිපත් කළ යුතු අතර වෙන්දේසියෙන් මිල දී ගනු ලබන සියලුම භාණ්ඩ සඳහා එවලේ ම මුදල් ගෙවා රිසිට් පතක් ලබා ගත යුතුය.

මිලදී ගනු ලබන භාණ්ඩ 2007.07.27 දින පැය 16.30 ට පෙර ඉවත් කර ගත යුතු අතර එසේ ඉවත්කර නොගන්නා භාණ්ඩ පිළිබඳ වග කියනු නොලැබේ.

වෙන්දේසිය සඳහා භාණ්ඩ ඉදිරිපත් කිරීම, විකුණූ බවට තහවුරු කිරීම, වෙන්දේසියෙන් භාණ්ඩ ඉවත් කර ගැනීම ආදී තීරණයන් ගනු ලබන්නේ වෙන්දේසි මණ්ඩලය බැවින් ඔවුන්ගේ තීරණය අවසාන තීරණය වේ.

ඩබ්ලිව්. පී. දයාරත්න,
ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි,
නියෝජ්‍ය අණදෙන නිලධාරි.

උපසේවා පොලිස් මූලස්ථානය,
කිව් පාර, කොළඹ 02.

### උපලේඛනය

| භාණ්ඩය | ප්‍රමාණය |
|---|---|
| 01. සිංහල යතුරු ලියන | 12 යි |
| 02. ඉංග්‍රීසි යතුරු ලියන | 16 යි |
| 03. රෝනියෝ මැෂින් | 01 යි |
| 04. මේස විදුලි පංකා | 05 යි |
| 05. පාපැදි | 09 යි |
| 06. අහල් 34 කල්දේරම් | 02 යි |
| 07. අහල් 36 කල්දේරම් | 02 යි |
| 08. අහල් 24 කල්දේරම් | 08 යි |
| 09. අහල් 14 කල්දේරම් | 03 යි |
| 10. අහල් 12 කල්දේරම් | 01 යි |
| 11. කල්දේරම් ලොකු | 03 යි |
| 12. මල්ටි පොට් | 04 යි |
| 13. තණකොළ කපන මැෂින් | 01 යි |
| 14. දම්වැල් කියත් | 01 යි |
| 15. වතුර ෆිල්ටර් | 02 යි |
| 16. වතුර පොම්ප ඉන්ධන | 01 යි |
| 17. සිටුවා තබන විදුලි පංකා | 03 යි |
| 18. බිත්ති විදුලි පංකා | 20 යි |
| 19. විදුලි හිරමන | 01 යි |
| 20. එලිමන්ට් කේතල් | 01 යි |
| 21. ඇලුමිනියම් තේ පෝච්චි | 01 යි |
| 22. විදුලි ජනක යන්ත්‍ර | 01 යි |
| 23. කැඩුනු යකඩ පුටු කෑලි | 150 යි |
| 24. කැඩුනු ශීතකරණ | 01 යි |
| 25. කැඩුනු යකඩ කබඩ් | 05 යි |
| 26. කැඩුණු යකඩ අල්මාරි | 01 යි |
| 27. ගිනි නිවන උපකරණ | 03 යි |
| 28. ගුවන් විදුලි යන්ත්‍ර | 01 යි |
| 29. රූපවාහිනි යන්ත්‍ර | 03 යි |
| 30. බොයිලේරු | 01 යි |
| 31. පාවිච්චි කරන ලද දුරකථන | 01 යි |
| 32. විදුලි පන්දම් | 01 යි |
| 33. ලන්තෑරුම් | 01 යි |
| 34. අබලන් වූ යකඩ කබඩ් කෑලි | 03 යි |
| 35. ඇම්පියර් සෙට් | 01 යි |
| 36. අලවංගු | 02 යි |

07-221

---

# ආණ්ඩුවේ නොවන දැන්වීම්

## සමාගමක නම වෙනස් කිරීමේ ප්‍රසිද්ධ දැන්වීම

2007 අංක 7 දරන සමාගම් ආඥාපනතේ 9 (2) වැනි වගන්තිය ප්‍රකාර කරනු ලබන නිවේදනය

සමාගමේ කලින් තිබූ නම සීමාසහිත කැනේසියන් හවුසිං (පුද්ගලික) සමාගම. සමාගමේ අංකය එන්. (පී. වී. එස්) 46455 දාතම 2006.06.02 සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය අංක 34/9, 2 වන පටුමග, කොස්වත්ත පාර, නාවල. සමාගමේ අළුත් නම - දාතම - 2007.05.30 සීමාසහිත කල්‍යානි හවුසිං ඇන්ඩ් ප්‍රොපර්ටි ඩිවෙලොපර්ස් (පුද්ගලික) සමාගම.

සීමාසහිත එකවුන්ටන්සි ඇන්ඩ් සෙකටේරියල්
සර්විසස් බියුරෝ සමාගම
ලේකම්වරු.

2007 ජුනි මස 14 වැනි දින,
අංක 86, එස්. ද එස්. ජයසිංහ මාවත,
කොහුවල,
නුගේගොඩ.

07-178/1

## සමාගමක් සංස්ථාපිත කිරීමේ ප්‍රසිද්ධ දැන්වීම

2007 අංක 7 දරන සමාගම් ආඥාපනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර කරනු ලබන නිවේදනයයි

සමාගමේ නම:-
සීමාසහිත වයි. එල්. ඩී. හෝල්ඩින්ස් (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය:- පී. වී. 60126 දාතම.– 2007.06.05
සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය:- ගහසිරිපුර, තිස්සමහාරාම.

සීමාසහිත එකවුන්ටන්සි ඇන්ඩ් සෙකටේරියල්
සර්විසස් බියුරෝ සමාගම,
ලේකම්වරු.

2007 ජුනි මස 14 වැනි දින,
අංක 86, එස්. ද එස්. ජයසිංහ මාවත,
කොහුවල,
නුගේගොඩ.

07-178/2

## සමාගමක් සංස්ථාපිත කිරීමේ ප්‍රසිද්ධ දැන්වීම

2007 අංක 7 දරන සමාගම් ආඥාපනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර කරනු ලබන නිවේදනය

සමාගමේ නම.-
සීමාසහිත ප්‍රොමෝවොව් ඉනෝවේට් (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය.- පී. වී. 60043 දාතම.– 2007.05.29
සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය.- 6-බී, 6 වන පටුමග, පාගොඩ පාර, නුගේගොඩ.

සීමාසහිත එකවුන්ටන්සි ඇන්ඩ් සෙකටේරියල්
සර්විසස් බියුරෝ සමාගම,
ලේකම්වරු.

2007 ජූනි මස 14 වැනි දින,
අංක 86, එස්. ද එස්. ජයසිංහ මාවත,
කොහුවල,
නුගේගොඩ.

07-178/3

---

## සමාගමක් සංස්ථාපිත කිරීමේ ප්‍රසිද්ධ දැන්වීම

2007 අංක 7 දරන සමාගම් ආඥාපනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර කරනු ලබන නිවේදනය

සමාගමේ නම.- සීමාසහිත ඉන්ඩස්ට්‍රියල් ක්ලෝතිං එක්ස්පෝට් ට්‍රේඩින් හවුස් (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය.- පී. වී. 60154
දාතම.– 2007.06.05
සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය.- අංක 69, ජයලත් ගොඩනැගිල්ල, 3 වන මහල, නව කැළණි පාලම පාර, ඔරුගොඩවත්ත, වැල්ලම්පිටිය.

සීමාසහිත එකවුන්ටන්සි ඇන්ඩ් සෙකටේරියල්
සර්විසස් බියුරෝ සමාගම,
ලේකම්වරු.

2007 ජූනි මස 14 වැනි දින,
අංක 86, එස්. ද එස්. ජයසිංහ මාවත,
කොහුවල,
නුගේගොඩ.

07-178/4

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

කෝට්ටේ, පිටකෝට්ටේ, එපිටමුල්ල පාර හි පදිංචි මොටා ආරච්චිලාගේ ගංගනාත් බුද්ධික කුමාරසිංහ යන අය විසින් වර්ෂ 2006ක් වූ අගෝස්තු මස 24 වැනි දින නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් අරුණ රොහාන් ගමිලත් මහතා විසින් සහතික කරන ලද, අංක 2271, දරන ඇටෝර්නි බලපත්‍රය මගින් රත්නපුර, හිදැල්ලන, පනුකරාපිටිය හි පදිංචි හපුආරච්චිගේ දෝන කල්‍යාණි මානෙල් යන මා හට පවරන ලද ඇටෝර්නි බලය මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කොට අහෝසි කොට අවලංගු කරනු ලැබේ.

හපුආරච්චිගේ දෝන කල්‍යාණි මානෙල් වන මා අද දිනයේ පටන් ඉහත කී මොටා ආරච්චිලාගේ ගංගනාත් බුද්ධික කුමාරසිංහ යන අයගේ ඇටෝර්නි බලකාරිය වශයෙන් කටයුතු නොකරන බවට මෙයින් දන්වා සිටිමි.

හපුආරච්චිගේ දෝන කල්‍යාණි මානෙල්.

වර්ෂ 2007ක් වූ මැයි මස 23 වැනි දින දී ය.

07-241

---

## සමාගමක් සංස්ථාපිත කිරීමේ ප්‍රසිද්ධ දැන්වීම

2007 අංක 7 දරන සමාගම් ආඥාපනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර කරනු ලබන නිවේදනය

සමාගමේ නම.-
සීමාසහිත ඔන්චි ඩිබග් සොලියුෂන්ස් (පුද්ගලික) සමාගම,
සමාගමේ අංකය.- පී. වී. 60009 දාතම.– 2007.05.21
සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය.- 58, 42 වන පටුමග, වැල්ලවත්ත, කොළඹ 06.

සීමාසහිත එකවුන්ටන්සි ඇන්ඩ් සෙකටේරියල්
සර්විසස් බියුරෝ සමාගම,
ලේකම්වරු.

2007 ජූනි මස 14 වැනි දින,
අංක 86, එස්. ද එස්. ජයසිංහ මාවත,
කොහුවල,
නුගේගොඩ.

07-257

---

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

මත්තේගොඩ, පොල්ගස්ඕවිට, සල්ගස් මාවත, අංක 145/3, හි පදිංචි රුහුණුගේ කමලාවතී *නොහොත්* රුහුණුගේ කුසුමලතා වන මා විසින් පද්මා කන්නන්ගර ප්‍රසිද්ධ නොතාරිස් ලියා සහතික කළ අංක 1936 හා 2002.01.24 දින දරන ඇටර්නි බලපත්‍රය මගින් දෙහිවල, අත්තිඩිය, සමගි මාවත, අංක 138 හි පදිංචි රුහුණුගේ ධම්මික ප්‍රසාද් යන අය මාගේ ඇටර්නි බලකරු ලෙස පත් කරන

ලදී. ඒ අනුව මා දැනට ශ්‍රීලංකාවට පැමිණ ඇති බැවින් එකී අංක 1936 හා 2002.01.24 දින දරන ඇටර්නි බලපත්‍රය මෙයින් අවලංගු කරනු ලබන බව ශ්‍රී ලංකාවාසී සියලු දෙනාගේම දැනගැනීම පිණිස දන්වා සිටිමි.

ආර්. කමලාවතී.

07-149

---

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

පානදුරේ, අළුබෝමුල්ලේ, මහවල පාරේ, අංක 327/සී 1 දරන ස්ථානයේ පදිංචි මුදලිගේ උපාලි අරුණශාන්ත වන මා විසින් ප්‍රසිද්ධ නොතාරිස් එම්. ටී. එම්. බාෆික් මහතා විසින් වර්ෂ 2005 ක් වූ දෙසැම්බර් මස 19 වැනි දින ලියා සහතික කළ අංක 9616 දරන ඇටෝර්නි බලපත්‍රය මගින් ඉහත කී ලිපිනයේම පදිංචි හාල්පන්දෙනිය වීබැද්දරාළලාගේ සනත් ප්‍රේමලතා යන අය වෙත පවරන ලද ඇටෝර්නි බලය මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කොට අහෝසිකොට අවලංගු කරනු ලැබේ.

එකී ඇටෝර්නි බලකරු විසින් මින් ඉදිරියට මාගේ ඇටෝර්නි බලකරු වශයෙන් කරනු ලබන කිසිම කටයුත්තකට මා විසින් වගකියනු නොලැබේ.

මුදලිගේ උපාලි අරුණශාන්ත.

07-271

---

## නිවේදනයයි

2007 අංක 7 දරන සමාගම් ආඥාපනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත දක්වා ඇති සමාගම සංස්ථාගත කිරීම පිළිබඳව අපි මෙසේ දැනුම් දී සිටිමු.

සමාගමේ නම.- අයිවීඅයි. හෝල්ඩින්ගස් (ප්‍රයිවට්) ලිමිටඩ්, අංක 47, ඇලෙක්සැන්ඩ්‍රා පෙදෙස, කොළඹ 07.
සමාගමේ අංකය.- පී. වී. 60222
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය.– අංක 47, ඇලෙක්සැන්ඩ්‍රා පෙදෙස, කොළඹ 07.
සංස්ථාගත කරන ලද දිනය.– 2007 ජුනි 11

සමාගම් ලේකම්වරු,
කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

07-237

හොස්පිටල් ඇන්ඩ් හෝම් කෙයාර් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම 2007 ජුනි 14 වන දින සංස්ථාපනය කරන ලද බව 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වන වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම– හොස්පිටල් ඇන්ඩ් හෝම් කෙයාර් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය.– පී. වී. 60271
ලියාපදිංචි කාර්යාලය .– අංක 372, ගාළු පාර, කොළඹ 03.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය පරිදි,

මැනේජ්මන්ට් ඇන්ඩ් බිස්නස් ඇඩ්වයිසරි සර්විසස් ලිමිටඩ්,
ලේකම්වරු.

07-238

---

## 2007 අංක 07 දරන සමාගම් පනත

ස්ටර්ලිං ගෲප් ලංකා ඉන්ටිමේට්ස් (ප්‍රයිවට්) ලිමටඩ් (PV 60178)

ඉහත සඳහන් සමාගම 2007 ජුනි මස 6 වන දින 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වගන්තිය ප්‍රකාර සංස්ථාගත කළ බවත් එහි ලේඛනගත කාර්යාලය කොළඹ 12, වේල්ල වීදිය, අංක 365 හි නීතිඥවරුන්වන ජෝන් විල්සන් පාට්නර්ස් ආයතනයේ කාර්යාලයේ පිහිටා තිබෙන බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

කීර්ති වීරසේකර (නීතිඥ),
ලේකම්,
ස්ටර්ලිං ගෲප් ලංකා ඉන්ටිමේට්ස් (ප්‍රයිවට්)ලිමිටඩ්.

2007 ජුනි මස 11 වැනි දින.

07-232

---

2007 අංක 07 දරන සමාගම් පනත ප්‍රකාරව පහත සඳහන් සමාගම 2007 ජුනි මස 22 දින සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම.– දයාරා ඔටෝමෝබයිල්ස් (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය.– පී. වී. 60366
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය .– අංක 683/ඒ, හයිලෙවල් පාර, විජේරාම හංදිය, නුගේගොඩ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

පී. එන්. එස්. කුමාරතුංග,
සමාගමේ ලේකම්.

07-275

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

## ලංකා බැංකුව

ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 22 වැනි වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

ණය යොමු අංකය : වී/8/98.

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2006 දෙසැම්බර් මස 29 දිනැති අංක 1478 දරන *ගැසට් පත්‍රයේ* හා 2006 දෙසැම්බර් මස 21 දිනැති ඩේලිනිවුස්, දිනමිණ සහ තිනකරන් යන පුවත්පත්වල පළ කරන ලද යෝජනාවකට අනුකූලව එකී ආඥාපනතේ අංක 26 දරන වගන්තිය යටතේ අයකර ගත හැකි මුල් මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොලිය ද, ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ, කොළඹ 10, ටී. බී. ජයා මාවත, අංක 497 හි පිහිටි ලංකා බැංකුවේ ගබඩා පරිශ්‍රයේ දී 2007 අගෝස්තු මස 15 වැනි දින පෙ. ව. 11.00 ට මහනුවර, ටොරින්ටන් පාර, අංක 24 හි පදිංචි වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

### වාහනය පිළිබඳ විස්තර

| *වාහනයේ ලියාපදිංචි අංකය* | *නිෂ්පාදනය පිළිබඳ විස්තර* | *චැසි අංකය* | *එන්ජින් අංකය* |
|---|---|---|---|
| 251-6154 | මෝස්තරය/HP ටොයෝටා | Cr 270083452 | 2C-2667164 |

ආර්. පී. රත්නසේකර මහත්මිය,
ශාඛා කළමනාකරු.

ලංකා බැංකුව,
අයගම.

07-290

---

## සීමාසහිත සෙලාන් බැංකුව - මාලඹේ ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ අංක 4 වන වගන්තිය යටතේ විකිණීම

මෙම දේපළ පාදුක්ක හි ලියාපදිංචි අංක ඩබ්ලිව් ඊ 190 දරන ගලගෙදර "මෙටල් ක්‍රෂර්ෂ්" යන නාමය විලාශය සහ අභිධානය යටතේ ව්‍යාපාරයක් පවත්වාගෙන යන තලංගම උතුරෙහි කංකානිලාගේ ලයනල් කරුණාරත්න පෙරේරා යන අය බන්ධනදායී වශයෙන් සීමාසහිත සෙලාන් බැංකුව වෙතින් ලබා ගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*පළමු විකිණීම.*– බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ පල්ලේ පත්තුවේ කොරතොට ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු සී. ඊ. එන්. ජයවර්ධන විසින් සාදන ලද 1994 මාර්තු මස 10 දිනැති අංක 711 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන දැන් ලේක් ටෙරස් නමින් හඳුන්වනු ලබන වනපොතුමූකලාන *හෙවත්* වයි එස්ටේට් නමැති ඉඩමේ කැබලි අංක 24 ලකුණු කළ සම්පූර්ණ ඉඩම් කැබැල්ල පෙර කී අංක 711 දරන සැලැස්ම අනුව පර්චස් විසි පහයි දශම හතයි අටක් (අ. 0 රූ. 0 පර්. 25.78) *නොහොත්* හෙක්ටයාර් 0.0652 ක් විශාල ගොඩනැගිලි සහ එහි පිහිටි වෙනත් සියළු දේ සමග ඉඩම. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්ඉරුව පී 974/180 යටතේ ලියාපදිංචි කර ඇත. ඉහත සඳහන් දේපල 2007 අගෝස්තු මස 02 වැනි දින පෙ. ව. 10.00 ට පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපලට පිවිසීම.*– අතුරුගිරියේ සිට ශාන්තාලෝකගම පාරේ (මිලේනියම් සිටි නිවාස සංකීර්ණය පසුකර) සැතපුම් 1.5ක් ගොස් දකුණට ඇති ලේක් ටෙරස් පාරේ පළමු අඩියර යනුවෙන් සඳහන් ස්ථානයේ පිහිටා ඇත. (යාර 150ක් පමණ දුරින්).

*දෙවන විකිණීම.*– බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරළේ මැද පත්තුවේ සීතාවක ප්‍රාදේශීය සභා සීමාව තුළ ගලගෙදර පිහිටි 1975.10.04 දිනැති අංක 5861 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ගල්ගොඩේවත්ත නමැති ඉඩමේ කැබලි අංක 2 ඩී ලකුණු කළ බෙදා වෙන් කරන ලද සම්පූර්ණ ඉඩම් කොටස ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් විසි නමයහමාරක් (අක්. 0 රූඩ් 01, පර්. 29.5) විශාල ගොඩනැගිලි ගස්, යන්ත්‍ර සූත්‍ර සහ එහි පිහිටි සියලු දේ සමග ඉඩම. මෙය අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එන් 8/39 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත සඳහන් දේපළ 2007 අගෝස්තු මස 02 වැනි දින පෙ. ව. 11.30ට ඉහත දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.*– ගලගෙදර හංදියේ සිට පාදුක්ක පාරේ යාර 50ක් ගිය විට දේපලට පිවිසිය හැක. යෝජනා සම්මුති දැන්වීම 2005.05.06 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* ද 2005.04.19 වැනි දින ඩේලි නිව්ස්, දිනමිණ සහ තිනකරන් යන පුවත්පත්වල ද පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.*– සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැණුම් මිලෙන් 10%ක් (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1%ක් වන පළාත් අධිකාරී බද්ද (සියයට එකක්), 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000, 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 500, (6) සියලුම ප්‍රචාරක වියදම් ද ගැණුම් මිලෙන් ඉතිරි 90% ද විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත සීමාසහිත සෙලාන් බැංකුවට ගෙවා නිම කළ යුතුය.

නිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නීති), සීමාසහිත සෙලාන් බැංකුව, අංක 90, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක : 011-2456285, 2456263, 2456284.

තුසිත කරුණාරත්න,
බලයලත් වෙන්දේසිකරු,
උසාවි කොමසාරිස් සහ තක්සේරුකරු.

ටීඇන්එච් ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත,
කොලොන්නාව.
දුරකථන අංක : 011-2696155, 011- 2572940

07-287

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 1904400113.

ණයකරුගේ සම්පූර්ණ නම : හඳුන් පතිරන්නැහැලාගේ චන්ද්‍රරත්න.

(මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2002.10.25 වන දින අංක 1260 දරන ආණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* සහ වර්ෂ 2002.10.25 වන දින "දිනමිණ",සහ "ද අයිලන්ඩ්" සහ "තිනක්කුරල්", පුවත්පත්වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකරගැනීම පිණිස (කෙසේ වුව ද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකර ගැනීම සඳහා) පහත විස්තර කර තිබෙන දේපළ, අංක 22, ප්‍රනාන්දු ඇවනිව්, ඩයස් ගරාජ් ගොඩනැගිල්ල, මීගමුව යන ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු වන ඩබ්. පී. සී. පෙරේරා මහතා විසින් 2007.07.31 වැනි දින පෙ. ව. 11.00 සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් එක්ලක්ෂ හතලිස් පන්දහස් තුන්සිය අනූහතයි ශත හතලිස් නමයක (රු. 1,45,397.49) මුදලක් වර්ෂ 2002.02.28 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපළ උකස මත සංස්ථා බැංකුවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් අනූහත්දහස් හාරසිය හතයි ශත නමයක (රු. 97,407.09) මුදල ද, 2002.02.28 වැනි දින දක්වා පොලිය වශයෙන් රුපියල් හතලිස්හත්දහස් නමසිය අනූවයි ශත හතලිහක් (රු. 47,990.40) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් එක්ලක්ෂ හතලිස්පන්දහස් තුන්සිය අනූහතයි ශත හතලිස් නමයක් (රු. 1,45,397.49) ද,

(2) එකී රුපියල් අනූහත්දහස් හාරසිය හතයි ශත නමයක (රු. 97,407.09) මුදල මත අයවිය යුතු වර්ෂයකට 15.50% බැගින් වන පොලියක් 2002.03.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීමට.

### උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, හලාවත ලියාපදිංචි කොට්ඨාසයේ උතුරු පිටිගල් කෝරලේ මුන්නේශ්වරම්පත්තුවේ ඇලිව්ටිය ගම් පිහිටි බක්මීගහවත්ත නමැති ඉඩමට 1992.01.11 දින එම්. එම්. පී. ඩී. පෙරේරා මානකතැන විසින් මැන සැකසූ අංක 774 දරන පිඹුර ප්‍රකාර අංක 1 දරන කොටසේ උතුරට: ටී. එච්. එම්. හේරත් බණ්ඩාට අයත් ඉඩම ද ; නැගෙනහිරට: ජේ. එම්. කිරිහාමිට අයත් කැබලි අංක 2 ද, ; දකුණට : බෝම්බුවල සිට බංගදෙනියේ ආණමඩුව දක්වා ඇති ගම්සහා පාර ද, සහ ; බටහිරට: ටී. එච්. එම්. ගාමිණීට අයත් ඉඩම ද යන මායිම් තුළ පිහිටි රූඩ් දෙකක (අක්. 0 රූ. 2 පර්. 0) විශාල ඉඩම වේ. මෙය හලාවත ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 125/297හි ලියාපදිංචි කර ඇත.

වර්ෂ 2007ක් වූ ජූනි මස 28 වැනි දින කොළඹ දී ය.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

07-286

---

## සීමාසහිත හැටන් නැෂනල් බැංකුව – නුගේගොඩ ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් යූ. එස්. කේ. හේරත් විසින් සහතික කරන ලද්දාවූ ද, සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ නමට ලියන ලද්දාවූ ද 2001.10.19 දින සහ 2002.04.09 වැනි දිනයන්හි අංක 969 සහ අංක 1031 දරන බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ඒ. එස්. ඇන්ඩ් එස්. ඒ. බිල්ඩින් ඩිසයිනර්ස් සහ කන්ට්‍රැක්ටර්ස් යන නාමය විලාශය යටතේ තනි පුද්ගල ව්‍යාපාරයක් පවත්වාගෙන යන සමින්ද මහානාම දිසානායක ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් ද,

සීමාසහිත හැටන් නැෂනල් බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ 2007 ජූලි මස 27 වැනි දින පෙ. ව. 11.00 ට ඇරඹෙන පරිදි දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, උඩුගහ පත්තුවේ, අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ, එගොඩපොත උප කාර්යාල සීමාව තුළ කලල්පිටිය ගමේ පිහිටි දැනට නුවර පාරේ වරිපනම් අංක 950/281 දරන "වදුරාපොල වත්ත" නැමති ඉඩමට බලයලත් මානක එස්. පී. ආර්. පතිරාජ විසින් මැන සාදන ලද 1997 ක් වූ සැප්තැම්බර් මස 16 වැනි දිනැති අංක 2233 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 281 හා ලොට් 282 දරන ඉඩම වේ.

විශාලත්වය : ලොට් 281 යි පර්චස් 10.3 යි
ලොට් 282 යි පර්චස් 10.9

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2007.04.05 දින දරන *රජයේ ගැසට් පත්‍රය* හා 2007.05.22 වැනි දින අයිලන්ඩ්, දිවයින සහ තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.*– වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%)ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එක (1%)ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5%) ක් ද,
4. ලිපිකරු හා සෝෂක ගාස්තු රුපියල් පන්සියය (රු. 500)ක් ද,
5. සියලුම ප්‍රචාරක වියදම්,
6. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදාහ (රු. 2,000) ක් ද වේ.

ගැණුම් මිළෙන් ඉතිරි 90% ක් වූ මුදල විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත සීමාසහිත හැටන් නැෂනල් බැංකුව වෙත ගෙවිය යුතුය. දින 30 ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට සහ දේපල නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාල ඔප්පු හා අදාල ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු, ප්‍රධාන කළමනාකරු (ණය අයකිරීම්), සීමාසහිත හැටන් නැෂනල් බැංකුව, අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10, දුරකථන අංක 2661815, 2661816 ගෙන් ලබාගත හැක.

එන්. එච්. පී. එෆ්. ආරියරත්න,
උසාවි කොමසාරිස් හා බලයලත් වෙන්දේසිකරු.

අංක 34/31 සහ 32,
නීතිඥ කාර්යාල සංකීර්ණය,
කොළඹ 12.

07-283

---

## මහජන බැංකුව – කෙහෙල්වත්ත ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අධිකාරී පත්තුවේ මාකොල දකුණ පිහිටි "මිල්ලලහවත්ත" බ/මී ඩී. සී. ඇම්. ඇස්. විමලරත්න විසින් සාදන ලද අංක 71/1995 දරන පිඹුරේ අංක 2 ලෙස ලකුණු කර ඇති ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 423/92 යටතේ ලියාපදිංචි වී ඇති (අ. 0, රූ. 0, පර්. 10) බිම් කොටස සහ එහි පිහිටි සියලු දේ, මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් 2007.07.28 වැනි දින පෙ. ව. 11.30 ට දේපල පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දේපල වෙන්දේසි යෝජනාව 2007.02.22 දින පුවත්පත් මගින් ද, 2007.03.09 දින *රජයේ ගැසට් පත්‍රයේ* පළකර ඇති යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපලට පිවිසීම.*–කොළඹ සිට නුවර පාරේ කිරිබත්ගොඩ දක්වා ගොස් එතැනින් මාකොළ පාරට හැරී සැතපුම් 02 ක් පමණ ගිය පසු දකුණු පසට ඇති කල්‍යාණී මාවතේ සැතපුම් 1/4 පමණ ගිය පසු පාරේ දකුණු පස මෙම දේපල පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*– වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැණුම් මිළෙන් 10%ක් ද,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 01%ක් ද,
3. වෙන්දේසියේ කොමිස් වශයෙන් විකුණුම් මිළෙන් 2 1/2%ක් ද,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500 ක් ද,
5. විකුණුම් වියදම් සහ වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා වෙනත් ගාස්තු.

ගැණුම් මිළෙන් 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30 ක් ඇතුළත කොළඹ 01, ආදිපාද වීදියේ, අංක 11 හි පිහිටි මහජන බැංකු බටහිර කලාප කාර්යාලයේ සහකාර සාමාන්‍යාධිකාරී බටහිර කලාප 01ට ගෙවිය යුතුය.

දුරකථන අංක 2387068, ෆැක්ස් අංක 2435977 හිමිකම් ඔප්පු හා වෙනත් අදාළ විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක. ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30 ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10%ක මුදල් ආපසු නොගෙවීමට සහ නැවත දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අර්වින් පෙරේරා,
සාමවිනිසුරු වෙන්දේසිකරු, උසාවි
කොමසාරිස්, තක්සේරුකරු භාෂා පරිවර්තක.

අංක 03, පාගොඩ පාර,
නුගේගොඩ.
දුරකථන අංක : 2810145/0777-212602.

07-282

## ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 22 වැනි වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

පී. ඕ. ඩී. යොමු අංකය : 222/97.

එස්. රේණුකා ප්‍රනාන්දු මහත්මිය බාරේ, අංක 2/23, 7 වන හරස් පාර, පානදුර හි ඉරුප්පුගේ ප්‍රියන්ත කිත්සිරි ප්‍රනාන්දු මහතා.

ලංකා බැංකු ආඥාපනතේ 19 වෙනි වගන්තිය යටතේ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2007.05.18 දිනැති අංක 1498 දරන *ගැසට් පත්‍රයේ* හා 2007.05.10 දිනැති ඩේලිනිවුස්, දිනමිණ සහ තිනකරන් යන පුවත්පත්වල පළ කරන ලද යෝජනාවකට අනුකූලව එකී ආඥාපනතේ අංක 26 දරන වගන්තිය යටතේ අයකර ගත හැකි මුල් මුදලේ ශේෂයද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොලියද, ගාස්තු හා මුදල්ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපල හා පරිශ්‍ර පිහිටි ස්ථානයේ දීම 2007 අගොස්තු 04 වැනි දින පෙ.ව. 11.00 ට, කොළඹ 03, හැව්ලොක් පාර, අංක 290 හි පදිංචි වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණේ, පානදුර තල්පිටි දෙබැද්දේ පානදුර සුලු නගර සභා සීමාවේ වලපොල පට්ටිය හි පිහිටි මුණමල්ගහවත්ත *හෙවත්* කැටකෑලගහවත්ත නැමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එල්. ඩබ්. එල්. ද සිල්වා විසින් සාදන ලද 1973 පෙබරවාරි මස 11 දිනැති අංක 573 දරන පිඹුරේ විස්තර කළ ලොට් "1ඒ" වශයෙන් සඳහන් බෙදන ලද්දාවූ නිශ්චිත ඉඩම් කැබැල්ල උතුරට: ශ්‍රී ආරියරත්නාරාම පාරද, නැගෙනහිරට: ජෝතිරත්න මාවතද, දකුණට: එම ඉඩමේ ලොට් 2 ද, බස්නාහිරට: එම ඉඩමේ ලොට් 1බී ද, මායිම්ව එකී අංක 573 දරන පිඹුර අනුව පර්චස් අටයි දශම අටක (අ.0, රූ.0, පර්. 8.8) බිම් ප්‍රමාණය සමග එහි පිහිටි ගහකොළ වැවිලි ගොඩනැගිලි සහ සියලු දේ වේ. මෙම ඉඩම පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ශීර්ෂ එෆ් 60/114 යටතේ ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

ටී එච්. එන්. ඥාණසිරි,
කළමනාකරු.

ලංකා බැංකුව,
කඩවීදිය ශාඛාව,
පානදුර.

07-289

---

## සීමාසහිත සම්පත් බැංකුව

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ විකුණුම් නිවේදනය

ආර්. පී. ආර්. රිශාන්ත - ගිණුම් අංක : 0025 5002 2373.

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2003.09.25 වැනි දින යෝජනා සම්මත කරගනු ලැබ 2003.12.26 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* ද 2003.12.12 දිවයින, අයිලන්ඩ් සහ 2003.12.15 වන දින තිනකරන් යන දිනපතා පුවත්පත් වලද පළ කරන ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් පනස්දෙදහස් පන්සිය විසිහතකුත් ශත හැට නවයක (රු.52,527.69 ක් පමණයි) මුදලද සහ තවත් රුපියල් හතලිස් හත් දහස් අටසිය අනූපහක (රු. 47,895 ක් පමණයි) මුදල සඳහා වසරකට සියයට විසිහතර (24%) බැගින් 2003 ජූලි 01 වැනිදා සිට වෙන්දේසි දින තෙක් තවදුරටත් පොලී මුදලද සමග ප්‍රචාරක වියදම් හා වෙනත් අය කිරීම් වෙතොත් ඒවාද සමග එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනැවින් විස්තර කොට ඇති දේපල හා පරිශ්‍රය මහනුවර බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය විසින් 2007.08.01 දින ප. ව. 1.30 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ දකුණ අස්ගිරි පල්ලේසිය පත්තුවේ කවුඩුපැලැල්ලේ පිහිටි උතුරු මාතලේ වත්ත නමින් හැඳින්වෙන ඉඩමට/ ඉඩමෙන් මාතලේ බලයලත් මිනින්දෝරු ජේ. එම්. ජයසේකර විසින් සාදන ලද 1999 මාර්තු 10 දාතම හා අංක 3041 දරන පිඹුරේ ලොට් 1ඒ 2 ලෙස නිරූපිත මාතලේ ඉඩම් කාර්යාලයේ බී483/249 හි ලියාපදිංචි කොට ඇති උතුරට: ලොට් 1 ඒ 1 ලෙස නිරූපිත එම ඉඩමේම ඉතිරි කොටසද නැගෙනහිරට: දඹුල්ල සිට මාතලේ දක්වා ප්‍රධාන මාර්ගයද, දකුණට: ලොට් 1 බී ලෙස නිරූපිත එම මෙම ඉඩමේම ඉතිරි කොටසද, සහ බටහිරට: ලොට් 1ඒ1 (කනත්ත) ලෙස නිරූපිත මෙම ඉඩමේම ඉතිරි කොටසද මායිම් වන ප්‍රමාණයෙන් පර්චස් විසිදෙකයි දශම පහක් (අක්. 0, රූඩ්. 0, පර්. 22.5) වන බෙදා වෙන් කොට සීමා නිර්ණය කල සම්පූර්ණ බිම් කොටස එහි ඇති සෑම සියලු දේ සමගය.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සමාගමේ ලේකම්.

07-295/1

---

## සීමාසහිත සම්පත් බැංකුව

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ විකුණුම් නිවේදනය

එම්. ඒ. ජී. මන්තිරිරත්න - ගිණුම් අංක : 1002 5025 3375.

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ

මණ්ඩලය විසින් 2003.11.27 වැනි දින යෝජනා සම්මත කරගනු ලැබ 2007.03.02 වන දින *රජයේ ගැසට් පත්‍රයේ* ද 2007.02.20 දිවයින, අයිලන්ඩ් සහ තිනකුරල් යන දිනපතා පුවත්පත් වලද පළ කරන ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් පන්ලක්ෂ එකොලොස් දහස් හයසිය තිස් එකකුත් ශත හැටදෙකක (රු. 5,11,631.62) මුදලද, තවත් රුපියල් තුන් ලක්ෂ අසූ දහස් දෙකක (රු. 3,80,002) මුදල සඳහා වසරකට සියයට විසිදෙක (22%) බැගින් 2003 ඔක්තෝබර් 04 වැනිදා සිට වෙන්දේසි දින තෙක් තවදුරටත් පොලී මුදල ද සමග ප්‍රචාරක වියදම් හා වෙනත් අය කිරීම් වෙතොත් ඒවාද සමග එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනැවින් විස්තර කොට ඇති දේපල හා පරිශ්‍රය මහනුවර බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය විසින් 2007.08.03 දින පෙ. ව. 11.00 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පලාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරලේ, ගහබොඩ පත්තුවේ, දොම්පේ ප්‍රාදේශීය සභා සීමාව ඇතුලත, මණ්ඩාවල පිහිටි දොඩන්ගස්පිටිකන්ද නැමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු එස්. එම්. චන්ද්‍රසිරි විසින් සාදන ලද 1994 මැයි මස 08 දාතම හා අංක 265බී පිඹුරේ ලොට් 2ඊ වශයෙන් ලකුණු කොට නිරූපිත ගම්පහ ඉඩම් කාර්යාලයේ ඩී 213/268 යටතේ ලියාපදිංචි කොට ඇති උතුරට: ලොට් 2ඒ, 2ජී සහ 2 එෆ් ද, නැගෙනහිරට: ලොට් 2ජී, 2එෆ් සහ 2එච් ද දකුණට: ලොට් 2එෆ් සහ රජයට අයත් දොඩන්ගස් පිටි කන්දද සහ බටහිරට: ලොට් 1 ද, මායිම් වන ප්‍රමාණයෙන් අක්කර එකයි පර්චස් විසි අටයි දශම දෙකක් (අක් 1, රූඩ් 0, පර්. 28.2) වන බෙදා වෙන් කොට සීමා නිර්ණය කළ සම්පූර්ණ ඉඩම.

මතු දැක්වෙන ඉඩම මතින් හා ඔස්සේ මාර්ග අයිතිය ද සමග ය.

ඉහත කී මණ්ඩාවල පිහිටි දොන්ගස්පිටිකන්ද නැමැති ඉඩමේ ඉහත කී අංක 265බී, පිඹුරේ ලොට් 2ජී (මාර්ගය සඳහා වෙන් කල කොටස) ලෙස ලකුණු කොට දක්වා ඇති උතුරට: පාර සහ ලොට් 2බී, 2සී සහ 2ඩී ද, නැගෙනහිරට: ලොට් 2බී, 2සී, 2ඩී සහ රජයට අයත් දොඩන්ගස්පිටිකන්දද, දකුණට: ලොට් 2එච්, 2එෆ්, 2ඊ සහ 2ඒ ද සහ බටහිරට: ලොට් 2එෆ්, 2ඊ සහ 2 ඒ ද මායිම් වන ප්‍රමාණයෙන් පර්චස් විසිනවයයි දශම හයක් (අක්. 0, රූඩ්. 0, පර්. 29.6) වන ගම්පහ ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්ඉරුව ඩී295/7 යටතේ ලියාපදිංචි කර ඇති බෙදා වෙන්කොට සීමා නිර්ණය කල සම්පූර්ණ ඉඩම් කොටස ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

07-295/2

---

### සීමාසහිත සම්පත් බැංකුව

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවි ධාන) පනතේ 09 වන වගන්තිය යටතේ විකුණුම් නිවේදනය

ගිණුම් අංක : 0018 5000 6462 - එම්. එම්. ඩී. පී. මලල්සේකර.

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2005.10.27 වැනි දින යෝජනා සම්මත කරගනු ලැබ 2006.09.01 වන දින *රජයේ ගැසට් පත්‍රයේ* ද 2006.08.25 දිවයින, අයිලන්ඩ් සහ තිනකුරල් යන දිනපතා පුවත්පත් වලද පළ කරන ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් අටලක්ෂ හතලිස් දෙදහස් අටසිය හැටහතකුත් ශත පනස් පහක (රු. 842,867.55) සමග තවත් රුපියල් පන්ලක්ෂ තිස්එක් දහස් හයසිය හතලිස් දෙකකුත් ශත තිස් දෙකක (රු. 5,31,642.32 ) මුදල සඳහා වසරකට සියයට විස්ස (20%) බැගින් 2005 අගෝස්තු 18 වැනිදා සිට වෙන්දේසි දින තෙක් තවදුරටත් පොලී මුදල ද සමග ප්‍රචාරක වියදම් හා වෙනත් අය කිරීම් වෙතොත් ඒවාද සමග එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනැවින් විස්තර කොට ඇති දේපල හා පරිශ්‍රය මහනුවර බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය විසින් 2007.08.03 දින ප. ව. 3.00 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පලාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණේ, පානදුර තල්පිටි දෙබැද්දේ, පානදුර ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුල, තල්පිටිය උතුර පිහිටි බලයලත් මිනින්දෝරු එස්. ඩී. එදිරිවික්‍රම විසින් සාදන ලද 1998 ජූලි 15 දාතම (එහෙත් 1998 පෙබරවාරි 18 ලෙස ලියාපදිංචි කොට ඇති) හා අංක 1041 දරන පිඹුරේ නිරූපිත පොල්කන්දවෙල කට්ටිය *නොහොත්* පබියගේ ඔවිටේ කට්ටිය නැමැති පානදුර ඉඩම් කාර්යාලයේ එෆ් 384/76 ශීර්ෂය යටතේ ලියාපදිංචි කොට ඇති උතුරට : පොල්කන්දවෙල (කලින් සියදෝරිස් සිල්වා අයිතිය කියූ දේපල) ද සහ තල්පිටිය ඇලද නැගෙනහිරට : තල්පිටිය ඇලද, දකුණට : පාර (කලින් අන්දිරිස් පෙරේරා සහ තවත් අය අයිතිය කියූ දේපල) ද සහ බටහිරට : බලයලත් මිනින්දෝරු එම්. එම්. ඩී. කුරේ විසින් සාදන ලද කලින් ජුවානිස් සිල්වා අයිතිය කියූ පිඹුරු අංක 250 හි ලොට් 1ඒ සහ ලොට් 1ඩී ද මායිම් වන ප්‍රමාණයෙන් පර්චස් විසි එකයි දශම පහක් (අක්. 0, රූඩ්. 0, පර්. 21.5) හෝ හෙක්. 0.05438 ක් වන බෙදා වෙන් කොට සීමා නිර්ණය කළ සම්පූර්න ඉඩම් කොටස එහි ගහකොල, වගාවන්, ගොඩනැගිලි සහ අනෙකුත් සියලු දේ සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

07-295/3

---

### කොමර්පල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් - වෙන්නප්පුව ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර

බලයලත් මානක එස්. එම්. දිසානායක විසින් 2001 ජනවාරි 04 වන දින සාදන ලද අංක 1528 දරන පිඹුර පරිදි වයඹ පළාතේ පුත්තලම් දිස්ත්‍රික්කයේ මාරවිල ලියාපදිංචි කිරීමේ කොට්ඨාස සීමාව තුළ දකුණු පිටිගල් කෝරලේ යටකලන් පත්තුවේ, ඉහළ කොස්වාඩියේ පිහිටි මදන්ගහහිස් ඉඩමේ ඇති සියලු දේ සමග බෙදා වෙන් කරන ලද ලොට් 04, පර්චස් 18.5 (අ. 0, රූ. 0, ප. 18.5) ක විශාල ඉඩම සහ ඒ තුළ ඇති සියලු දේත් සමග වේ.

බලයලත් මානක ආර්. එස්. එච්. ප්‍රනාන්දු විසින් 2004 දෙසැම්බර් 03 වැනි දින සාදන ලද අංක 4738 දරන පිඹුර පරිදි වයඹ පළාතේ පුත්තලම් දිස්ත්‍රික්කයේ මාරවිල ලියාපදිංචි කිරීමේ කොට්ඨාශ සීමාව තුළ දකුණු පිටිගල් කෝරළේ, යටකලන් පත්තුවේ ඉහළ කොස්වාඩියේ පිහිටි මදන්ගහවත්ත හිස් ඉඩම නැමැති පර්චස් විස්සක් (අ. 0, රූ. 0, පර්. 20) විශාල ඉඩම සහ ඒ තුළ ඇති සියලුදේත් සමග වේ.

වර්ණකුලසූරිය විපුල් උපශාන්ත ප්‍රනාන්දු සහ පිරිස්යාලගේ ප්‍රියන්ති ණයකරුවන්/උකස්කරු හැටියට ද, ඔවුන් විසින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් ට උකස් කරන ලද ඉහත සඳහන් කල දේපළ, වර්ෂ 2007 ක්වූ අගෝස්තු මස 10 වැනි දින පෙ. ව. 11.30ට ඉහත ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසිය ආරම්භ කරනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2007.02.23 දින *රජයේ ගැසට් පත්‍රය ද*, දිවයින ද අයිලන්ඩ් සහ තිනකරන් පත්‍ර ද විකිණීම පිළිබඳ දැන්වීම සඳහා 2007.07.13 දින *රජයේ ගැසට් පත්‍රයද*, 13.07.2007 දින දිවයින සහ අයිලන්ඩ් පත්‍රය ද බලන්න.

*ඉඩමට පිවිසීම.*–කොළඹ - හලාවත ප්‍රධාන මාර්ගය ඔස්සේ තල්විල හන්දිය දක්වා ගොස් තල්විල හන්දියේ සිට මීටර් 250ක් ඇතින් දකුණට ඇති ගොරකැලේ ෆාම් නැමති පාරට හැරෙන්න. මෙම පාරදිගේ මීටර් 60ක් පමණ යනවිට වම් අත පැත්තට පිහිටා ඇති මෙම දේපළට ළඟාවිය හැකිය.

*ගෙවීමේ ක්‍රමය.*–විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුයි.

01. ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),
02. පළාත් සභා අයබදු සඳහා සියයට එකක් (1%),
03. වෙන්දිසිකරුගේ කොමිස් මුදල් ගැණුම් මිලෙන් සියයට දෙකයි දශම පහක්, (2.5%)
04. නොතාරිස් ගාස්තුව රු. 2,000,
05. ලිපිකරු සහ සෝෂක වේතනය රු. 500,
06. වෙන්දේසිය සඳහා වැය කරන ලද සියළුම ප්‍රචාරක වියදම්,
07. ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30ක් තුළ දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි ප්‍රධාන කාර්යාලයේ හෝ වෙන්නප්පුව ශාඛාවේ තැන්පත් කළ යුතුයි.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න.

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු, උසාවි කොමසාරිස්, කොළඹ
වාණිජ මහාධිකරණය සහ දිසා අධිකරණය,

බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු, රාජ්‍ය සහ වාණිජ බැංකු
අංක 99, උසාවිය පාර, කොළඹ 12
දුරකථන/ෆැක්ස් අංකය : 2445393.

කළමණාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්,
අංක 262, 264
කොළඹ පාර,
වෙන්නප්පුව.
දුරකථන අංක : 031-2253444-5 031-2255552-3,
දුරකථන/ෆැක්ස් අංකය : 031-2255551

07-245
B3 -B 079521

## ආර්. එස්. එම්. ඔක්ෂන්ස් - මාතලේ ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ පවත්වනු ලබන දේපල වෙන්දේසිය

සීමාසහිත හැටන් නැෂනල් බැංකුව මා ලත් බලය මත පහත සඳහන් දේපල පිහිටි ස්ථානයේ දී 2007 අගෝස්තු 07 වන දින පෙ. ව. 11.00 ට මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මධ්‍යම පළාතේ , මාතලේ දිස්ත්‍රික්කයේ දැනට මාතලේ නැගෙනහිර රත්තොට නගර සභා සීමාව තුළ මාතලේ නැගෙනහිර පල්ලේ පත්තුවේ රත්තොට හොම්පොල්ල තැන්නේ පිහිටි වරිපනම් අංක 18 දරන කහටගහමුලවත්ත *හෙවත්* කහටගහමුලහේන නමින් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මානක ඒ. දොලොස්වැල විසින් 1966.10.10 වන දින සහ බලයලත් මානක ජේ. එම්. ජයසේකර විසින් 1968.04.01 වන දින සාදන ලද අංක 104 දරන උප බෙදුම ප්‍රකාර බෙදා වෙන්කරන ලද ලොට් ඩී 1 සහ ලොට් සී දරන ඉඩම් කැබලි. ඉඩමේ ප්‍රමාණය ලොට් ඩී 1 - අ. 0, රූ. 0, ප. 3/ලොට් සී - අ. 0, රූ. 0, ප. 1.2 මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් එම්. එස්. පෙරේරා විසින් සහතික කරන ලද්දා වූද සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ නමට ලියන ලද්දාවූ ද 2005.02.15 දින සහ අංක 601 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම අබ්දුල් කරීම් මොහොමඩ් රිසාර්ඩ් ණයකරු හැටියට පැහැර හැර ඇත.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2005.11.18 වන දින රජයේ *ගැසට් පත්‍රය* සහ 2006.11.23 වන දින දරන අයිලන්ඩ්, දිවයින හා තිනකරන් යන පුවත් පත්‍ද බලන්න.

*ගෙවීමේ ක්‍රමය.*–වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

01. ගැණුම් මුදලින් 10% ක්ද (සියයට දහයක්),
02. ප්‍රාදේශීය සභා බදු සඳහා 01% (සියයට එකයි) සහ වැට් බද්ද 15% (සියයට පහළවක්),
03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම්මිලෙන් 2 1/2% (සියයට දෙක හමාරක්),
04. සියළුම ප්‍රචාරක වියදම් ද,
05. ලිපිකරු හා සෝෂක වේතනය රු. 500,
06. නොතාරිස් ගාස්තුව විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් (සියයට අනූව) වූ මුදල වෙන්දේසියේ දින සිට දින 30ක් ඇතුලත ද සීමාසහිත හැටන් නැෂනල් බැංකුවට ගෙවා නිමකල යුතු වේ. දින 30ක් ඇතුළත ඉතිරි මුදල් නොගෙවුවහොත් ගෙවා ඇති 10% ආපසු නොගෙවීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න, කළමණාකරු සීමාසහිත හැටන් නැෂනල් බැංකුව, මාතලේ ශාඛාව, ටෙලි 066-2224409-10/066-2223868 හෝ ශ්‍රේෂ්ඨ කළමනාකරු (ණය ආපසු අයකර ගැනීම) අංක 479 ටී. බී. ජයා මාවත, කොළඹ 10. ටෙලි. 2661815, 2661816

ආර්. එස්. එම්. ඔක්ෂන්ස්,
මහානාම බ්‍රයිට්,
අංක 474, පිටකෝට්ටේ,
කොට්ටේ.

රංජිත එස්. මහානාම,
සාම විනිසුරු (මුළු දිවයිනටම),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු
සහ බලයලත් වෙන්දේසිකරු.

දුරකථන අංක : 2863121

07-279/1

### මහජන බැංකුව - කාත්තාන්කුඩිය ශාඛාව

#### කාත්තාන්කුඩි පිහිටි වටිනා නිවාස සහිත දේපළ, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

**1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම**

මහජන බැංකුවෙන් මාහට පවරන ලද බලතල යටතේ පහත සඳහන් දේපළ ලබන 2007.08.04 වැනි දින වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ඉඩමේ විස්තර.*–බලයලත් මිනින්දෝරු සී. පත්මනාදන් මයා විසින් පිළියෙළ කරන ලද අංක 467/89 හා 1989.10.18 වැනි දිනැති පිඹුරේ "ගොඩ ඉඩම වත්ත" යනුවෙන් හැඳින්වන අංක 34 නසාර් පටුමග කාත්තාන්කුඩිය හි පිහිටි අක්කර 0, රූඩ්. 0, පර්. 5.75 ක් ප්‍රමාණයෙන් යුතු ඉඩම හා ඊට අයිති ගොඩනැගිල්ල සමඟ ගස්කොළන් හා අනිකුත් සියළුදේත්.

*දේපළට පිවිසෙන මාර්ග.*–මඩකලපුව සිට කල්මුනේ බලා යන ප්‍රධාන මාර්ගයේ දකුණු පසේ පිහිටි ප්‍රාදේශීය සභා මාර්ගය හරහා යාර 200ක් පමණ දුරින් පිහිටා තිබෙන නසාර් පටුමග හී දකුණු පසේ අංක 34 හි මෙම දේපළ පිහිටා ඇත.

*වැඩි විස්තර සඳහා.*–2002.09.10 දිනැති තිනකරන්, ඩේලි නිවුස් පුවත්පත් හා 2002.04.12 වැනි දිනැති *ගැසට් පත්‍රය* බලන්න.

*ගෙවීමේ ක්‍රමය.*–වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවිය යුතුය.

1. ගැණුම් මිලෙන් 25%,
2. පළාත් අධිකාරියේ බදු සඳහා ගැණුම් මිලෙන් 1%,
3. වෙන්දේසියේ කොමිස් වශයෙන් ගැණුම් මිලෙන් 2 1/2%,
4. විකුණුම් වියදම් සහ වෙනත් ගාස්තු වෙතොත් එම මුදල ගැනුම් මිලෙන් ඉතිරි 75% ක්වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත මහජන බැංකුව මඩකලපුව ශාඛාවට ගෙවිය යුතුය. එම මුදල දින 30 ඇතුළත නොගෙවුවහොත් පෙර ගෙවන ලද මුදලින් 10%ක් වියදම් ලෙස අහිමි වන අතර, නැවත දේපළ වෙන්දේසියේ විකිණීමට මහජන බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු හා වැඩි විස්තර මඩකලපුව මහජන බැංකු ප්‍රාදේශීය කාර්යාලයේ ලබාගත හැක.

දුරකථන අංක : 065-2222652, 065-2222653.

ඒ. ඊ. කේ. තිසවීරසිංහ,
බලයලත් වෙන්දේසිකරු හා උසාවි කොමසාරිස්.

අංක 08,
මුදලියාර් පාර,
මඩකලපුව.

07-249

### මහජන බැංකුව - ගාල්ල කොටුව ශාඛාව

#### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය මත මෙහි පහත විස්තර වන දේපල 2007.08.20 දින පෙ. ව. 11.00ට දේපල පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*උකස්කරන ලද දේපල පිළිබඳ විස්තරය*–මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ මහනගර සභා සීමාව තුළ, දොඩන්දෙනියේ පිහිටි ගල්ගනේහේන නමැති ඉඩමෙන් බෙදා වෙන් කරන ලද අංක 03 දරන පර්චස් 20ක් (අ. 0, රූ. 0, පර්. 20) විශාල ඉඩම සහ එහි පිහිටි වැව්ලි ගොඩනැගිලි ආදී සියලු දේ.

*රජයේ ගැසට් පත්‍රයේ* 1999.11.26 දින ද, දිනමිණ, ඩේලිනිවුස් හා තිනකරන් යන පුවත්පත් වල 1999.11.08 දින ද පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපලට පිවිසීම.*–මාතලේ මහනගර සභා පුස්තකාලය ඉදිරියෙන් වැටී ඇති හුලංගමුව පාරේ සැ. 1/4 ක් පමණ ගිය විට හමුවන හන්දියෙන් දකුණට වැටී ඇති මල්වත්ත පාරේ යාර 20ක් පමණ දුරින් ඇති අතුරු පාරේ වරිපනම් අංක 215/5 දරන ස්ථානයේ මෙම දේපල පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*–වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැණුම් මිලෙන් 10% ක් ද,
2. පළාත් අධිකාරියේ බදු සඳහා විකුණුම් මිලෙන් 1% ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ක් ද,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500 ක් ද,
5. විකුණුම් වියදම සහ වෙනත් ගාස්තු වෙතොත් එම මුදල ද
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු ද වේ.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත දී ගාල්ල පහළ ඩික්සන් පාරේ අංක 22 දරන ස්ථානයේ පිහිටි මහජන බැංකුව ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ ප්‍රාදේශීය කළමනාකාර මහතාට ගෙවිය යුතුය.

හිමිකම් ඔප්පු හා වැඩි විස්තර මඩකලපුව මහජන බැංකු ප්‍රාදේශීය කාර්යාලයේ ලබාගත හැක.

දුරකථන අංක : 091-2223563/4, 2232311, 2234171 හා 2234174
ෆැක්ස් අංක : 091-2232230

ඉහත සඳහන් කරන ලද පරිදි ඉතිරි මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගැණුම් මිලෙන් ගෙවා ඇති 10%ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ජී. පී. ආනන්ද,
(සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
උසාවි කොමසාරිස් සහ තක්සේරුකරු.

කුරුදුවත්ත,
වල්ගම-මාතර
දුරකථනය : 041-2228731

07-251

## සීමාසහිත හැටන් නැෂනල් බැංකුව - බියගම ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. ඩී. අල්විස් විසින් සහතික කරන ලද්දාවූ ද සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ නමට ලියා සහතික කරන ලද්දාවූ ද 2004.03.25 දින සහ අංක 1080 දරන බැදුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම මොහොමඩ් නිසාර් නූර්ඩීන් නිෆ්ෆාරි යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින්, සීමාසහිත හැටන් නැෂනල් බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපල 2007 ජුලි මස 30 වැනි දින පෙ. ව. 11.00 ට මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, මැද කෝරළේ හෙලඋඩ පත්තුවේ, ඇල්ලේපොල ගමේ පිහිටි "ගල්කොරටුවේහේන" (කොටසක්) නමින් ද හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මානක ඒ රත්නම් විසින් මැන සාදන ලද 2003.12.04 දිනැති අංක 2078/03 දරන ඉඩමෙන් බෙදා වෙන් කරන ලද ලොට් ඒ දරන ඉඩම විශාලත්වය පර්චස් 37.5.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2007.01.19 දින *රජයේ ගැසට්* පත්‍රය සහ 2007.02.07 වැනි දින අයිලන්ඩ්, දිවයින, තිනකරන් යන පුවත් පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.*–වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුයි.

01. ගැණුම් මුදලින් 10% ක්ද (සියයට දහයක්),
02. ප්‍රාදේශීය සභා බදු සඳහා 01% (සියයට එකයි),
03. වෙන්දිසිකරුගේ කොමිස් මුදල් විකිණුම් මිලෙන් 2 1/2% (සියයට දෙක හමාරක්),
04. විකුණුම් සහතික සඳහා මුද්දර ගාස්තු සහ විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදහ (රු. 2,000ක් ද),
05. ලිපිකරු හා සෝෂක ගාස්තු රුපියල් පන්සියය (රු. 500)ක් ද,
06. විකුණුම් වියදම් සහ වෙනත් ගාස්තු වෙතොත් එම මුදලක් ද වේ.

ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%)ක් වූ මුදල වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත සීමාසහිත හැටන් නැෂනල් බැංකුව වෙත ගෙවිය යුතුය. දින 30ක් ඇතුලත ඉතිරි මුදල් නොගෙවුවහොත් ගෙවා ඇති 10% ආපසු නොගෙවීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා අදාළ ලියවිලි පරීක්ෂා සහ වෙනත් තොරතුරු විමසන්න. කළමණාකරු සීමාසහිත හැටන් නැෂනල් බැංකුව, අංක 479 ටී. බී. ජයා මාවත, කොළඹ 10, දුරකථන අංක : 2661815, 2661816.

රංජිත එස්. මහානාම,
සාම විනිසුරු (මුළු දිවයිනටම),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු
සහ බලයලත් වෙන්දේසිකරු.

ආර්. එස්. එම්. ඔක්ෂන්ස්,
මහානාම ඩ්‍රයිව්,
අංක 474, පිටකෝට්ටේ
කොට්ටේ.
දුරකථන අංක : 2863121

07-279/3

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.